බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 ජනවාරි මස 05 වන දින පෙ.ව.9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු සලෝචන ගමගේ මන්ත්‍රීතුමා විසින් ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවරධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015.10.20 වන දින අසන ලද ප්‍රශ්ණය: (ප්‍ර/VI (1) /15/40)

අ. ග්‍රාමීය බැංකුවල ඇති රත්‍රං භාණ්ඩ වෙන්දේසි කිරීමේදී නියෝජිත ආයතන ලෙස කටයුතු කරන්නේ කුමන ආයතනද?

ආ. ග්‍රාමීය බැංකු හා නියෝජිත ආයතන අතර ඇති බැඳීම හා වගකීම කුමක්ද? (වෙන්දේසියක් වන අවස්ථාවේදී)

ඇ. ඒ සඳහා බලපවත්වන නීති මාලාව කුමක්ද?

ඈ. රත්‍රං භාණ්ඩ වෙන්දේසි සදහා ඉදිරිපත් කළ පසු එහි අවසානාත්මක තීරණ බලය ඇත්තේ කාටද?

02. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබද අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ඉ/VI (1) /15/76)

අ. 2012, 2013, 2014 වර්ෂ තුළ බස්නාහිර පළාතේ ලියාපදිංචි බෞද්ධ, හින්දු, මුස්ලිම්, දහම් පාසැල් කොපමණ සංඛ්‍යාවක් තිබේද?

ආ. එම එක් එක් ලියාපදිංචි දහම් පාසල් සංවර්ධනය සදහා කොපමණ මුදලක් ඒ ඒ වර්ෂ වල ලබා දී තිබේද?

ඇ. එම මුදල් ප්‍රතිපාදන සපයා ගත්තේ කුමන අරමුදලකින්ද?

ඈ. එසේ අරමුදල් ලබා නොදුන් ලියාපදිංචි දහම් පාසැල් තිබේද?

ඉ. එසේ ලබා නොදුන්නා නම් ඒ කුමක් නිසාද? එසේ ලබා දුන්නා නම් ඒ කුමන ක්‍රමවේදයකට අනුවද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :

යෝජනාව :

"2015-12-18 දින හා 2015-12-23 දින පැවති සභා කටයුතු පිළිබද කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව අද දින (2016-01-05) න්‍යාය පත්‍රයේ සඳහන් පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතු රීති අංක 15(4), 63(අ)(2), හා 63(අ)(3)හි සදහන් විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතුය."

# X.. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප)

යෝජනාව:

## *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය*
## *තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත*

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය - "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත", බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත, ඉදිරිපත් කර 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ, 154 ( උ) ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ, මෙම පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයක් අතිගරු ජනාධිපතිතුමාණන් වෙත වාර්තා කිරීමට හැකිවනු පිණිස, දින 12ක් ඇතුලත ලබාදෙන ලෙස, 2015-12-16 දිනැතිව, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාණන් විසින් දන්වා එවන ලදින්, 2015-12-22 දින සභා රැස්වීමේදි, එකී පනත් කෙටුම්පත පිළිබදව සාකච්ජා කරන්නට රැස්වුණු මුත්, පනත් කෙටුම්පතෙහි ඇති සංකීර්ණභාවය හේතුකොටගෙන, ඒ පිළිබදව ගැඹුරින් අධ්‍යයනය කර සාකච්ජා කරන්නට අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද, දැනට ලැබී ඇති කාල පරාසය, කිසිසේත් ප්‍රමාණවත් නොවන හෙයින්ද, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා සිටිය යුතු' යැයි මෙම පළාත් සභාව එදින නොබෙදී පළකල අදහස් අනුව, ප්‍රමාණවත් කාලයක් දැනටමත් ඉල්ලා ඇති අතර, 2015-12-23 දින සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදි එකඟතාවය පළකල පරිදි, අද දින (2016-01-05දින) මෙම පළාත් සභාව විසින්, එම "*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබද පනත් කෙටුම්පත*' සම්බන්ධව, සාකච්ජා කර, එළඹෙන තිරණයන්ට අනුකූලව, එම අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා, ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබාදිමට ක්‍රියාකළ යුතු' යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."

*(අදාළ ලේඛන පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත 2015.12.21 හා 22 යන දිනවල සභා රැස්වීමේදී බෙදා හැර ඇත.)*

## XI . පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු ඉන්දික බණ්ඩාර මන්ත්‍රීතුමා:**

"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුල රණවිරු ගම්මාන කිහිපයක්ම පිහිටුවා ඇති අතර, මෙම ගම්මාන වල පිවත් වන්නේ 30 වසරක් අප රට තුළ පැවති යුද්ධයෙන් අප මව්බිම මුදාගැනිම සදහා තම පිවිත පරිත්‍යාග කළ යුද්ධය නිසා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගෙ මවුපියන්, අඹුදරුවන්ය.

මැතිවරණ කාල සිමාවන් තුලදි සියලූ දේශපාලන පක්ෂ නියෝජිතයින් රණවිරු ගම්මාන වලට ගොස් ඡන්දය ලබා ගත්තද, එම ගම්මානවල වැසියන් ප්‍රවාහන, සෞඛ්‍ය, අධ්‍යාපන, පානිය ජලය නොමැතිකම වැනි ප්‍රශ්න රාශියකින් පිඩා විදිති. අප රට වෙනුවෙන් විශාල කැපවීමක් සිදුකළ රණවිරු ගම්මානවල වෙසෙන ජනතාවගේ ඉහත සදහන් අවශ්‍යතාවන් ඇතුලූ ගැටලූ සොයා බලා, ඒ සදහා පිළියම් ලෙස රණවිරු ගම්මාන වැසියන්ගේ පිවන තත්වය ඉහළ නැංවීම සදහා ක්‍රමවත් වැඩපිළිවලක් සකස් කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."

(යෝ/VI (1) /14/13)

**02. ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා:**

"බස්නාහිර පළාත තුළ වතු ආශ්‍රිතව විශාල ජනතාවක් පිවත් වන අතර, ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය යහපත් කිරීමේ සහ ඔවුන් මෙරට ආර්ථිකයේ ශක්තිමත් කොටස්කරුවන් බවට පත් කිරීමේ අරමුණෙන්, වතු පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටුවා ඇත. මෙම වතු පාසල්වල දරුවන්හට අධ්‍යාපනය නිසි පරිදි ලබාදිමට පහසුකම් රැසක් ස්ථාපිත කර ඇතත්, ඔවුන්ට අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන්ට දුෂ්කරතා රැසකට මුහුණදිමට සිදුව ඇත.

එම ගුරුවරුන් පත්වන දුෂ්කරතාවයන් අතර පාසලට ළඟාවිමට ඇති ප්‍රවාහන අපහසුතාවය ප්‍රධානතම කරුණක් වන අතර, එයට විසඳුමක් ලෙස බස්නාහිර පළාතේ සේවය කරනු ලබන සියලු වතු පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනිම සදහා බස්නාහිර පළාත් සභාවේ මැදිහත්විමෙන් යතුරු පැදියක් ලබාදිමට කටයුතු කිරීම සුදුසු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."

(යෝ/VI (1) /14/14)

## XII. සභාව කල් තැබීම

කේ.එච්.සී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.12.23 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.